**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය - 2023**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා වසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීමෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයනගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, හෝ විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 48 වන ඡේදය අනුව ආදායම් හා වියදම් හිලවු නොකළ යුතු වුවද අවස්ථා 3කදී එකතුව රු.3,705,256 ක් වූ ආදායම් වලින් එකතුව රු.2,564,662ක් වූ වියදම් හිලවු කර ශුද්ධ ආදායම ලෙස රු.1,140,594 ක් දක්වා තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පාරිතෝෂිත වෙන්කිරීම් රු 150,326,884.ක් වුවද විස්තරාත්මක උපලේඛනය අනුව එම අගය රු173,923,589. ක් වූයෙන් රු.23,596,706 ක නොසැසඳීමක් විය. | පාරිතොෂක වෙන්කිරීම ගණනය කිරීම පරිගණකය මගින් Excel යෙදවුම උපයෝගී කරගෙන සිදු කරනු ලබන අතර එහි ඇති වූ අඩුපාඩුවක් නිසා මෙම ඌනතාවය සහිත රු.150,326,884 මූල්‍ය ප්‍රකාශනවලට ගැලපී ඇති බව. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශේෂ උපලේඛන ශේෂ සමග සැසඳිය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී දේපළ ,පිරියත හා උපකරණ කාණ්ඩ 07කට අයත් අයිතම 12, 499ක වත්කම් භෞතිකව නොපවතින බවට තහවුරු කර ගැනීමකින් තොරව පිරිවැය හා සමුච්චිත ක්ෂය පොත් වලින් ඉවත් කර රු16,061,374. වත්කම් ඉවත් කිරීමේ අලාභයක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි දක්වා තිබුණි. | භෞතික සත්‍යාපනයක් මගින් 2023 අවසන් ගිණුම් වලට භෞතිකව පවතින වත්කම් පමණක් ගැලපීමට කටයුතු කරන ලදි. අස්ථානගත වූ වත්කම් තිබේනම් ඒ පිළිබඳව විධිමත් විමර්ශනයක් සිදුකර වගකිව යුතු නිලධාරීන්ට විනය ක්‍රියාමාර්ග ගැනීමටද වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ කාර්යය 2024 වර්ෂය තුළ අවසන් කිරීමටද අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදුකරන බව. | වත්කම් පොත්වලින් ඉවත්කිරීමේ ක්‍රියාවලිය විධිමත්ව සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු රු.2,180,659 ක් වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගැනීමකින් තොරව සෘජුව අරමුදල් ගිණුම්වලට බැර කර තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා අරමුදල් ගිණුම් ශේෂ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මෙහි සඳහන් අරමුදල් විශේෂිත අරමුණක් සඳහා ස්ථාපනය කරන ලද අරමුදල් වන අතර මෙම අරමුදල්වල අරමුණුවල ස්වභාවය අනුව ඒ සඳහා වන ලැබීම් සෘජුවම අදාළ අරමුදල් ගිණුම්වලට ගලපනු ලබන බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වර්ෂයේ ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබිය යුතුය. |
| (ඈ) | සේවක වෛද්‍ය රක්ෂණාවරණය වෙනුවෙන් 2023ජූලි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුළදී ගෙවන ලද රු 1,836,124.ක් වූ විශ්වවිද්‍යාල දායකය විශ්වවිද්‍යාලයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ලැබිය යුතු රක්ෂණ වාරික ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා ලැබිය යුතු ශේෂය එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි. | මෙය 2024 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබිය යුතුය. |
| (ඉ) | 2024 වර්ෂය තුළදී ස්ථාවර තැන්පත් ලෙස ආයෝජනය කරන ලද රු.21,064,300 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ආයෝජන යටතේ දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය හා ආයෝජන වටිනාකම එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි. | එම ආයෝජන ස්ථාවර තැන්පතුවල තැන්පත් කිරීම 2024 වර්ෂයේ ජනවාරි සහ මාර්තු යන මාසවල සිදු කරන ලද බව. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කරන දිනට පැවති වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබිය යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිවිසුම් හා බැඳුම්කර කඩකල නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.2,842,485 ක් 2024 මැයි 31 දින වන විටද අයකර ගෙන නොතිබුණි. | 2023 දෙසැම්බර් 31 දින වන විට අයකර ගත යුතුව තිබුණු ගිවිසුම් හා බැඳුම්කර වටිනාකම රු.3,175,801කි. 2024 මැයි වන විට එය රු.2,842,485ක් දක්වා අඩු වී ඇති බව. | අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 01සිට වර්ෂ 08දක්වා කාලයක් ගත වී තිබුණු එකතුව රු 16,742,520.ක් වූ තැන්පතු හා රඳවාගත් ශේෂ හා 2017 වර්ෂයේ සිට ඉදිරියට එන එකතුව රු 9,493,459.ක් වූ ප්‍රාග්ධන අත්තිකාරම් ශේෂ 6ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි . | තැන්පතු හා රඳවාගත් ශේෂ ඉදිරියේදී ගෙවීමටත් කොන්ත්‍රාත්කරු වෙත කරන ඉදිරි ගෙවීම් වලදී අත්තිකාරම් අයකර ගැනීමටත් කටයුතු කරනු ලබන බව. | දීර්ඝ කාලයක සිට පැවත එන ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වෙනත් ගෙවිය යුතු වියදම්වල ඇතුළත් වර්ෂ දෙකකට වඩා කාලයක සිට පැවත එන රු.1,429,689ක් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කර නොතිබුණි. | මේවාට අදාළ ගෙවීම් වවුචර්පත් තවමත් ලැබෙමින් පවතින අතර ඉතිරි ගෙවීම් නිරවුල් කිරීමට 2024 වර්ෂයේදී තටයුතු කරනු ලබන බව. | ගෙවියයුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 (අ) වගන්තිය | අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ දී රු.10,000,000 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | මුදල් කමිටු අනුමැතිය හා පාලක සභා නිර්දේශය සහිතව මෙම මුදල ආයෝජනය කර ඇත. | මුදල් පනත අනුව විධිමත් පරිදි අනුමැතිය ලබාගෙන ආයෝජනය න් සිදු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 103,104 | වටිනාකම රු.1,097,359 ක් පමණ වූ පුස්තකාල පොත් 3,940 ක් අස්ථානගත වීම සම්බන්ධයෙන් 2024 මාර්තු වන විටද මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව විමර්ශනය කර වාර්තාවක් ලබා දීම සඳහා 2020 ජූලි 23 වන දින පැවති 201 වන පාලක සභාව මගින් සාමාජිකයින් 05 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත්කර ඇති අතර කමිටුවේ කටයුතු සිදු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 2022/03 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 03 (viii) වගන්තිය | චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව සේවක වෛද්‍ය රක්ෂණ ක්‍රමය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.3,672,249 ක් විශ්වවිද්‍යාලය විසින් වැය කර තිබුණි. | සමස්ත වාරිකයෙන් සියයට 75ක ප්‍රතිශතයක් සේවකයින් විසින් දරනු ලැබේ. විශ්වවිද්‍යාලයේ ඉඩකඩ විදුලි සංදේශ කුළුණු සඳහා කුලියට දීමෙන් උපයාගත් අරමුදල් මේ සඳහා යොදා ගෙන ඇත. | චක්‍රලේඛ විධිවිධානවල ට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය | බැඳුම්කර කඩකරන ලද ආචාර්යවරයෙකුගෙන් සමාලෝචිත වර්ෂය තුළ දී අයකරගෙන තිබුණු රු.787,958 ක් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | බැඳුම්කර කඩකරන ලද ආදාර්යවරුන්ගෙන් අයකර ගන්නා ලද මුදල් විශේෂිත අරමුදලක් (Restricted Funds) යටතේ පවත්වා ගෙන යනු ලබන බව. | චක්‍රලේඛ විධිවිධානවල ට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2022 ජනවාරි 03 දිනැති අංක 01/2022 දරන විශ්වවිද්‍යාල | 2022 හා 2023 වර්ෂයන් සඳහා පුස්තකාල පොත් සමීක්ෂණය සිදුකර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා වන සංගණන කටයුතු 2023 වසරේදී අවසන් කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධානවල ට අනුකූලව කටයුතු කළ |

| | | |
|---|---|---|
| කොමිෂන් සභා චක්‍රලේඛයෙහි 4 වන වගන්තිය | | යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.39,829,581ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.62,619,435ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.22,789,854ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රාග්ධන ප්‍රදාන වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.1,022,650,000 ක් වූ ඉඩම් කැබලි 03 ක් විශ්වවිද්‍යාලය වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද අවසන් කර නොතිබුණි. | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය විසින් භුක්ති විඳින ලබන ඉඩම් පවරා ගැනීම් කටයුතු සිදු කරමින් පවතින බව. | ඉඩම් වල අයිතිය නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |